චක්‍රලේඛ අංකය 01-26/2006

සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යාංශය,
සුවසිරිපාය,
කොළඹ 10.

ක්ෂේත්‍ර පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියගේ රාජකාරි ලැයිස්තුව

01. පරිපාලන අවශ්‍යතා

i. රාජකාරි වේලාවන්

සතියේ දිනවල -
පෙ.ව. 08.00 සිට ප.ව.4.00 දක්වා
(පෙ.ව. 08.00 සිට ප.ව. 3.00 දක්වා ක්ෂේත්‍ර වැඩ, ප.ව. 3.00 සිට පස්වරු 04.00 දක්වා කාර්යාලීය වැඩ)
දිවා ආහාරය සඳහා පැයක කාලයක් ඉහත කාලය තුළදී සුදුසු පරිදි ලබාගත හැක

සායන දිනවල
පෙ.ව. 07.30 සිට පස්වරු 03.30 දක්වා

සෙනසුරාදා (ක්ෂේත්‍ර හෝ සායන සේවාව)
පෙ.ව. 08.00 සිට පස්වරු 01.00 දක්වා

ඉරිදා හා රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින
විවේක දිනයන් වේ. එවැනි දිනක වුවද රාජකාරි සඳහා කැඳවීමක් වුවහොත් සූදානමින් සිටිය යුතුය.
ක්ෂේත්‍ර නිලධාරීන් ලෙසින් අවශ්‍යතාවය මත රාජකාරි වේලාවෙන් අමතරව වුවද සේවාව ලබාදීමට සූදානමින් සිටිය යුතුය.

ii. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය තම රාජකාරි කොට්ඨාශයෙහිම පදිංචි විය යුතු අතර, ඇගේ කාර්යාලය ඇය පදිංචි ස්ථානයෙහිම හෝ තමාගේ ක්ෂේත්‍රයේ සුදුසු ස්ථානයක පවත්වා ගෙන යා යුතුය.

iii. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය රාජකාරියෙහි යෙදී සිටින සියළුම අවස්ථාවල අනුමත නිල ඇඳුමින් සැරසී සිටිය යුතුය.

iv. ඇගේ කාර්යාලය ඉදිරිපස හොඳින් පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරන ලද පුවරුවෙහි එදිනට රාජකාරි සඳහා යන ප්‍රදේශය, දිනය සහ වේලාව සටහන් කළ යුතුය.

02. කාර්යාලය

i. සිය කාර්යාලය ඉදිරිපිට හොඳින් පෙනෙන ස්ථානයක දෙපාර්තමේන්තු නිල නාම පුවරුව ප්‍රදර්ශනය කළ යුතුය.

ii. රාජකාරි වේලාවන් තුළදී අධීක්ෂණ නිලධාරීන්ට පරීක්ෂා කිරීමට හැකි වන සේ සකස් විය යුතුයි.

iii. පුහුණුව ලැබූ කාලයේ දී සහ දෙපාර්තමේන්තුව විසින් කලින් කලට දෙන ලද උපදෙස්වලට අනුව ඇගේ කාර්යාලය පවත්වා ගෙන යා යුතුය. කාර්යාලය පිළිවෙල කළ යුතු අයුරු ඇමුණුම I හි සඳහන් වේ.

03. *සාමාන්‍ය කටයුතු.*

i. ප්‍රදේශය තුළ සිටින සෑම ජන කොටසකටම (නාගරික,ග්‍රාමීය,වතු) අවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සැලසීම හා මග පෙන්වීම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ වගකීමක් වේ.

ii. කලින් කලට දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන මාර්ගෝපදේශයන්ට අනුව ඇයගේ ප්‍රදේශයේ සියලුම යෝග්‍යතා පවුල්වලට ක්‍රමානුකූලව සේවාව ලබාදීමට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය කටයුතු කල යුතුය.

iii. ගෘහ පිවිසීම්වලදීත් සායන පැවැත්වීමේදීත් මාතෘ හා ළමා සෞඛ්‍ය සංරක්ෂණය හා පවුල් සංවිධානය ඇයගේ මූලික වගකීම ලෙස සැලකිය යුතු අතර එම සේවාවන කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

iv. තම ප්‍රදේශයේ ආයතන, සංවිධාන, ප්‍රජා නායකයින්, ස්වේච්ඡා සේවකයින් සමඟ සහයෝගයෙන් කටයුතු කල යුතු අතර ඔවුන් විසින් ප්‍රජා මට්ටමින් සංවිධානය කරනු ලබන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ සටහන් වලට සහභාගි වී සිය උපදෙස් ලබාදී නිවැරදි මග පෙන්වීම් කළ යුතුය. ඒ සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුවේ.

v. මාසික රැස්වීම්, ප්‍රාදේශීය රැස්වීම්, සේවාස්ථ පුහුණු වැඩ සටහන් සඳහා නියමිත දින වලදී සහභාගි විය යුතුය. විශේෂ වැඩ සටහන් සඳහා සහභාගි වන ලෙස දැන්වූ විට ඒ අනුව කටයුතු කළ යුතුය.

vi. අනුමත ඉදිරි කාල සටහනට අනුව ප්‍රදේශයේ රාජකාරි කටයුතු කළ යුතුය. කිසියම් වෙනසක් කරන ලද්දේ නම් එවැනි වෙනසක් කිරීමට හේතු දක්වමින් ඒ පිළිබඳව අදාල ලේඛනයේද සටහන් තැබිය යුතුය.

vii. ඇයගේ භාරයේ පවත්නා සියලුම දෙපාර්තමේන්තු උපකරණ වලට ඇය වගකිව යුතු අතර, ඒවා පිරිසිදුව සහ මනා ක්‍රියාකාරී මට්ටමින් පවත්වා ගෙන යා යුතුය. නැතිවූ හෝ කැඩුනු සියලුම ද්‍රව්‍ය ගැන සෞඛ්‍ය 818 ආකෘති පත්‍රය මගින් ඇයගේ අධීක්ෂණ නිලධාරියාට වාර්තා කළ යුතුය. මු.රෙ. 102 පිළිපැදිය යුතුය.

viii. දෙපාර්තමේන්තු උපදෙස් අනුව සටහන් වාර්තා පවත්වා ගෙන යා යුතු අතර, ඒ අනුව අදාල වාර්තා නිවැරදිව නියමිත වේලාවට ඉදිරිපත් කළ යුතුය.

ix. දා: සෞ.වෛ.නි. අතිරේක සෞ.වෛ.නි, ම.සෞ.සෙ.ආචාරිණි (පුහුණු විධායක වල) ම.සෞ.සෙ.සො, ප.සා.ප.සෞ.සේ.නි යන අධීක්ෂණ කාර්ය මණ්ඩලයේ අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ තම රාජකාරිය ඉටු කළ යුතුය.

04. යෝග්‍යතා පවුල් සඳහා සංරක්ෂණය

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය සේවා කොට්ඨාශයට අනුයුක්ත කළ පසු මුල් මාස 6 තුළ සමීක්ෂණයක් මගින් ප්‍රදේශයේ සීමා, ආයතන, පවත්නා සම්පත්, විධිමත් අවිධිමත් නායකයින් ජනගහනය හා ඉලක්ක කණ්ඩායම් යනාදිය හඳුනාගැනීම කළ යුතුයි. දෙපාර්තමේන්තුවෙන් දෙන ලද

උපදෙස්වලට අනුව තම ප්‍රදේශයේ ඉලක්කගත පවුල් හඳුනාගත් විගසම ලියාපදිංචි කර එකී සංරක්ෂණය ලබාදීමට කටයුතු කළ යුතුය. (මේ සඳහා ඇමුණුම II උපයෝගී කරගත යුතුය.)

සෑම යෝග්‍යතා පවුලකටම අවම වශයෙන් මාස 6 කට වරක්වත් ගෘහ පිවිසීම් කර පවුලේ සෞඛ්‍ය අවශ්‍යතාවයන් හඳුනාගෙන අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කළ යුතුය. ඒ අනුව අදාල ලේඛන හා වාර්තාවල දත්තද අවශ්‍ය පරිදි යාවත් කළ යුතුය.

05. පූර්ව ප්‍රසව සංරක්ෂණය

i. ගර්භණී භාවයට පත්වන කාන්තාවන් පිළිබඳව සොයා බලා ගර්භණී භාවය දැනගත් විගසම ලියාපදිංචි කර සංරක්ෂණ කටයුතු ආරම්භ කළ යුතුය. ස්වාමි පුරුෂයා සහ පවුලේ සාමාජිකයින් සමග ගර්භණී මවට නිවසේදී ලබාදිය යුතු රැකවරණය/සැලකිල්ල සාකච්ඡා කළ යුතු අතර, අවශ්‍ය දැනුම ලබා දිය යුතුය.

ii. සෞඛ්‍යරාධ දිනයන්හිදී සායනවල යෙදෙන මවුවරුන්ගේ සංරක්ෂණ කටයුතු සඳහා ප්‍රමුඛතාවය දිය යුතුය.

iii. පුහුණුව ලැබූ කාලය තුළදී සහ කලින් කලට දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදෙස් අනුව ක්ෂේත්‍ර ගමන් වලදී සහ සායන වලදී පූර්ව ප්‍රසව සංරක්ෂණය ලබාදිය යුතුය (මෙම උපදෙස් ඇමුණුම III හි සඳහන් වේ).

iv. තම ප්‍රදේශයේ සිටින අවදානම් තත්වයන් සහිත මව්වරුන් නිවැරදිව හඳුනාගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ආයතන භාර වෛද්‍ය නිලධාරී මගින් ඔවුන් විශේෂඥ සේවා සඳහා අදාල ආයතන වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු අතර එම මව්වරුන් සඳහා පසු විපරම් කළ යුතුය.

06. ප්‍රසව සංරක්ෂණය

i. සෑම මවක්ම රෝහල් ප්‍රසූතියක් සඳහා සූදානම් කළ යුතු අතර තම ප්‍රදේශයේ ගෘහ ප්‍රසූත සිදු නොවීමට වග බලා ගත යුතුය. එසේත් හදිසියේ ගෘහ ප්‍රසූතියක් සඳහා කැඳවීමක් ලැබුනහොත් තමා ලබා ඇති න්‍යායික හා ප්‍රායෝගික දැනුම උපයෝගී කරගෙන එම ප්‍රසූතය සිදුකළ යුතුය.

ii. මව හෝ දරුවාට අනතුරුදායක තත්වයක් හඳුනා ගතහොත් එවැනි අවස්ථාවලදී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය සෘජුවම එම මව රෝහලට යොමු කළ යුතුය.

iii. හදිසි අවස්ථාවකදී ඇය මූලික පහසුකම් තිබෙන ළඟම පිහිටි රෝහලට මව ගෙන යා යුතුය. ඒ සඳහා ළඟම ඇති රෝහලකින් ගිලන් රථයක් ගෙන්වා ගැනීමට හෝ කුලී රථයකට මුදල් ගෙවා රෝගියා ප්‍රවාහනය කර එම මුදල් රජයෙන් ලබාගැනීමට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියට අයිතියක් ඇත.

iv දරුවා ඉපදී පසු ඉක්මනින් (පැය 1/2 ක් ඇතුළත) මව්කිරි දීමේ අවශ්‍යතාවය පිළිබඳව මව දැනුවත් කර කිරිදිය යුතු අතර මව්කිරි දීම ප්‍රවර්ධනය කිරීම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියගේ වගකීමක් වේ. (ඇමුණුම iv අනුගමනය කරන්න)

07. පසු ප්‍රසව සංරක්ෂණය.

i. පසු ප්‍රසව සංරක්ෂණය පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ රාජකාරී අතරින් ඉතා වැදගත් ස්ථානයක් ගනී. තම ප්‍රදේශයේ සියලුම පසු ප්‍රසව මව්වරුන් සඳහා නියමිත පරිදි ගුණාත්මක භාවයෙන් යුතු සංරක්ෂණයක් ලබාදීමට ඇය ප්‍රමුඛතාවයක් දිය යුතුය.

ii. පුහුණුව ලැබූ කාලයේදී සහ දෙපාර්තමේන්තුව විසින් කලින් කලට දෙනු ලබන උපදෙස් අනුව සියලුම මව්වරුන් සඳහා පසු ප්‍රසව සංරක්ෂණය ලබාදිය යුතුය (ඒ සඳහා ඇමුණුම V දක්වා ඇති උපදෙස් පිළිපැදිය යුතුයි).

iii. ඇයට දෙන ලද උපදෙස් අනුව ඇගේ පසු ප්‍රසව පෙට්ටියේ තිබෙන උපකරණ භාවිතා කිරීමට සුදුසු තත්වයේ පවතින බවට වගබලා ගත යුතුය. ඒ සඳහා අවශ්‍ය උපකරණ කලින් කලට ලබාගත යුතුවේ.

iv. මව හා දරුවාගේ රැකවරණය පිළිබඳවත් [illegible] පිළිබඳවත් ප්‍රජාව සහ පවුලේ අය දැනුවත් කල යුතුවේ.

v. මව හා නව ජන්ම දරුවා හොඳින් පරීක්ෂා කර [illegible] ඇත්නම් වහා රෝහල වෙත යොමු කල යුතුය.

vi. ප්‍රසවයෙන් සති 4 තුල පසු මව සහ ළදරුවා [illegible] කල යුතුය.

08. ළදරු ළමා සංරක්ෂණය.

i. ප්‍රදේශයේ සිටින සියලුම ළදරුවන් සහ පෙර පාසල් ළමුන් [illegible] සෞඛ්‍ය [illegible] සායනවල, දිවා සුරැකුම් මධ්‍යස්ථානවල, විදි දරුවන්ද ඇතුළුව [illegible] සංරක්ෂණය ගෙන [illegible] සහ සායන මගින් ලබාදිය යුතුය.

ii. අලුත උපන් දරුවා උපත් සහ ප්‍රතිශක්තිකරණ රෙජිස්ටරයේ [illegible] ලියාපදිංචි කල යුතුය. සෑම ළදරුවෙකුටම ළදරු හා ළමා වර්ධන සටහන් පතක් ඇති බවට වගබලා ගත යුතුවේ.

iii. ළදරු ළමා සංරක්ෂණය පිළිබඳ උපදෙස් ඇමුණුම VI හි දක්වා ඇති අතර ඒ අනුව කටයුතු කල යුතුය.

iv. විශේෂ රැකවරණයක් අවශ්‍ය සහ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් හඳුනාගෙන ඔවුන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමු කිරීම, පසු විපරම් කිරීම සහ විශේෂ අදාල රැකවරණ ලබාදීමට අවශ්‍ය කටයුතු කල යුතුවේ.

09. පාසැල් හා යොවුන් සෞඛ්‍ය

i. අවශ්‍ය අවස්ථාවලදී පාසල් සෞඛ්‍ය වැඩ සටහන් වලට සහාය දිය යුතුය.

ii. පාසල් වෛද්‍ය පරීක්ෂණ කටයුතු වලදී සොයාගත් ආබාධ සහිත ළමයින් පිළිබඳ පසු විපරම් කිරීමේ කාර්යයට සෞඛ්‍ය කණ්ඩායමට සහාය ලබාදිය යුතුය.

iii. ප්‍රදේශයේ සිටින යොවුන යොවුනියන් ගැන දැනුවත් කිරීමේ වැඩ සටහන් සෞ.වෛ.නි.ගේ උපදෙස් මත සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සමග සිදු කල යුතුය. මේ සඳහා උපදෙස් ඇමුණුම VII හි සඳහන් වේ.

iv. ගෘහ චාරිකාවලදී හමුවන පාසල් වයසේ දරුවන්ගේ ගැටලු හඳුනාගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීට ඉදිරිපත් කළ යුතුය. උදා: පාසල් නොයන ළමුන්, විශේෂ අවශ්‍යතා/ආබාධිත ළමුන්.

පවුල් සංවිධාන සේවාව

පවුල් සංවිධානය පිළිබඳව තම ප්‍රදේශයේ සේවා අවශ්‍ය පුද්ගලයින් සඳහා දැනුවත් කිරීම හා උපදේශන සැපයුම කර අවශ්‍ය පරිදි එම සේවා ලබාදීම හෝ ඔවුන් එම සේවා සඳහා යොමු කිරීම කළ යුතුය.

i. පවුල් සංවිධාන ක්‍රම අවශ්‍ය නමුත් භාවිතා නොකරන අය ප්‍රජාව තුළින් හඳුනාගෙන ඔවුන් සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී ක්‍රම භාවිතා කිරීම සඳහා පෙළඹවීම කළ යුතුය.
ii. වඳ භාවයෙන් යුත් යුවළ හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය උපදෙස් සහ ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම හා යොමු කිරීම කළ යුතුය.
iii. පවුල් සංවිධාන සේවාව සඳහා උපදෙස් ඇමුණුම VIII හි දක්වා ඇති අතර ඒ අනුව සේවය කළ යුතුය.
iv. ප්‍රදේශයේ සිටින අනපේක්ෂිත ගැබ්ගැනීම් සඳහා වැඩි අවදානමක් ඇති කාණ්ඩවල් හඳුනාගෙන (මෙම අය අතර යොවුන්, පසු ප්‍රසව සංකූලතා ඇතිවීමට වැඩි ඉඩකඩක් ඇති බැවින්) ඔවුන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කර සේවා පහසුකම් සැලසිය යුතුය.

II. ආයතන සේවාව

තම ප්‍රදේශයේ මව්වරුන් සහ දරුවන් හට සේවාව ලබාදෙන ආයතනික (දිස්ත්‍රික් රෝහල් හා ග්‍රාමීය රෝහල්වල) හා ක්ෂේත්‍ර සායන සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය සහභාගි විය යුතුය.

i. තම ප්‍රදේශයේ සායනයේ සේවාව සඳහා පෙර දින සෞඛ්‍ය මධ්‍යස්ථානය සකස් කොට පිළියෙල කළ යුතුය. රෝහල් තුළ පවත්වා ගෙන යන සායනයක් නම් එම රෝහල් කාර්ය මණ්ඩලයට සහාය ලබාදිය යුතුය.
ii. නියමිත කාලසටහන් තුළ සහ දෙපාර්තමේන්තුව විසින් වරින් වර දෙන උපදෙස් අනුව සායනවල සේවාව කරගෙන යා යුතුය. අධීක්ෂණ නිලධාරීන් විසින් පවරා ඇති වගකීම් ඉටු කිරීමට වගබලා ගත යුතුය (සායන සේවාව සඳහා උපදෙස් ඇමුණුම IX හි සඳහන් වේ).

12 පුවනාරී සායනික සේවාව

i. ඇගේ ප්‍රදේශයට අයත් පුවනාරී සායනයෙහි සේවාව වලට සහභාගි විය යුතුය. නොඑසේ නම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පවත්වන සායනයට තම වාරය අනුව සහභාගි විය යුතුය.
ii. පුවනාරී සායන සේවාව ලබාදීම සඳහා ඉලක්ක කණ්ඩායම නිවැරදි ලෙස හඳුනාගෙන සායන වෙත යොමු කිරීම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය විසින් කළ යුතුය.
iii. මේ සඳහා උපදෙස් ඇමුණුම X හි සහ පුවනාරී සායනික අත්පොතෙහි සඳහන් වේ.

13. විශේෂ කටයුතු

i. ඇයගේ ප්‍රදේශයේ මාතෘ මරණ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කිරීමේදී අධීක්ෂණ නිලධාරීන්ට සහාය විය යුතුය.

ii. තම ප්‍රදේශයේ සියලු මව් මරණ, ළදරු මරණ, ළමා මරණ සහ මළ දරු උපත් පිළිබඳව අධීක්ෂණ නිලධාරීන්ට දැනුම් දිය යුතුය. මහජන සෞඛ්‍ය හෙද සොයුරිය හෝ පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය නොමැති ප්‍රදේශවල ළදරු ළමා මරණ විමර්ශනය කිරීම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ වගකීමයි.

iii. ළමාවියේ ඇතිවිය හැකි පාචන රෝග සහ ශ්වසන රෝග සම්බන්ධව මව්වරුන් දැනුවත් කළ යුතු අතර එවැනි අවස්ථාවලදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම, යොමු කිරීම හා පසු විපරම් කළ යුතුය.

iv. ප්‍රජනන පද්ධතිය ආශ්‍රිත ආසාදන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ කටයුතු සායන පිහිටීම්වලදී හා ක්ෂේත්‍ර වලදී සිදුකළ යුතුය. (උදා:එච්අයිවී)

v. බෝවන රෝග සම්බන්ධයෙන් ප්‍රජාවට උපදෙස් දීමත් අවබෝධයක් ලබාදීමත් කළ යුතුය.

vi. දැනුම් දිය යුතු රෝග කිසිවක් අනාවරණය වුවහොත් ඒ ගැන ප්‍රදේශයේ සෞ.වෛ.නි/ මහජන සෞඛ්‍ය පරීක්ෂකට දැන්විය යුතුවේ.

vii. සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් අනුගමනය කිරීම තුළින් බෝ නොවන රෝග වලක්වා ගැනීම සම්බන්ධව ප්‍රදේශයේ ප්‍රජාව දැනුවත් කළ යුතුයි.

viii. ප්‍රජාවගේ මුඛ සෞඛ්‍ය පිළිබඳව නිවැරදි උපදෙස් දිය යුතු අතර මුඛ [illegible] රෝග ගැනීමට දැනුවත් කිරීමේ කටයුතු කළ යුතුය.

ix. ප.සෞ.සේ.නිලධාරිනියගේ ප්‍රදේශයේ සංවිධානය කරනු ලබන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ සටහන් වලට සහභාගී විය යුතුය.

x. සායන පිහිටීම්වලදී හා හැකි සෑම අවස්ථාවලදී පවුල් සෞඛ්‍යය, [illegible] පුද්ගල සනීපාරක්ෂාව සහ පරිසරය පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් ප්‍රජාව උපදෙස් දීම හා මග පෙන්වීම කළ යුතුය.

මධ්‍ය සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් හෝ ආයතන ප්‍රධානියා මගින් කලින් කලට අවශ්‍යතා අනුව පවරන ලද සේවයට අදාල සියලුම වෙනත් රාජකාරියක් වේනම් ඒ අනුව කටයුතු කළ යුතුය මෙ අනුව මීට පෙර නිකුත් කරන ලද රාජකාරි ලැයිස්තුව අවලංගු වේ.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වි.සෞ.සේ)

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා උපදෙස්

අ) බිත්තියෙහි ප්‍රදර්ශනය කළ යුතු දේවල්.

- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ ප්‍රවණතා සංඛ්‍යා සහ ලියාපදිංචි විශ්ලේෂණය.
- ප්‍රතිශක්තිකරණ ප්‍රවණතා සටහන
- ප්‍රදේශයේ සිතියම. (ග්‍රාම සේවා කොට්ඨාශ වෙන්ව සටහන් කළ යුතුය. පෝෂණ පවුල් සහ ජනගහනය ගම් අනුව සඳහන් කරන්න)
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් අනුමත කරන ලද මාසික ඉදිරි වැඩ සටහන
- ඊව සංඛ්‍යා හා ළඟාවිය යුතු පවුල් සෞඛ්‍ය සේවා ඉලක්කල ළඟා කරගත් සංඛ්‍යා සහ ප්‍රතිශතය
- හදිසි පාවිසන් (නමගේ සහ අධීක්ෂණ නිලධාරීගේ අත්සන සහිත විය යුතුය)

ආ) මේසය මත තැබිය යුතු දේවල්.

ලේඛන/වාර්තා/පොත් - අධීක්ෂණ නිලධාරීන්ට පරීක්ෂා කළ හැකිවන පරිදි මෙවා පිළි පෙළිදි තැබිය යුතුයි.

- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ දින සටහන් පොත (සො. 511)
  (මෙය ක්ෂේත්‍රයට යනවිට රැගෙන යා යුතුවේ)
- පෝෂණ පවුල් ලේඛන (සො: 526) (අවුරුදු 5 කට වරක් නව ලේඛන සැකසිය යුතුයි)
- ගර්භනී මව්වරුන්ගේ ලේඛනය සො. 513
- උපත් හා ප්‍රතිශක්තිකරණ ලේඛනය එපිඅයි 3/79 (අවුරුදු 14 ක කාලයක් කාර්යාලයේ පවත්වා ගත යුතුය)
- පවුල් සංවිධාන මාසික වාර්තාව සො. 1200
- මාසික බලාපොරොත්තු ප්‍රසව ලේඛනය සො: 515
- පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය
- බඩු වට්ටෝරු ලේඛනය සහ දෙපාර්තමේන්තු උපදෙස්
- අමුත්තන්ගේ ලේඛනය
- කාල සටහන වෙනස් කිරීමේ පොත (මාසය අවසානයේදී මෙම වෙනස්කිරීම් අධීක්ෂණ නිලධාරියෙකු විසින් අත්සන් කළ යුතුය)
- අනිකුත් අදාල කාලීන වාර්තා
- විශේෂ කාර්ය ලිපි ගොනුව

II. සටහන් පත්/ පාවිසන්/උපකරණ

- ගර්භනී සටහන් පත් සහ ට
- මාස 3 ක කාලයක් සඳහා පසු ප්‍රසව පාවිසන්

කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා උපදෙස්

අ) විශේෂයෙන් ප්‍රදර්ශනය කළ යුතු දේවල්.

- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ ප්‍රවීණතා සහතිකය සහ ලියාපදිංචි වීමේ සහතිකය.
- ප්‍රතිශක්තිකරණ ප්‍රවීණතා සහතික
- ප්‍රදේශයේ සිතියම. (ග්‍රාම සේවා කොට්ඨාශ වෙන් වෙන් කළ යුතුය. යෝග්‍යතා පවුල් සහ ජනගහනය ගම් අනුව සඳහන් කරන්න)
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් අනුමත කරන ලද මාසික ඉදිරි වැඩ සටහන
- ජීව සංඛ්‍යා හා ළඟාවිය යුතු පවුල් සෞඛ්‍ය සේවා ඉලක්කවල ළඟා කරගත් සංඛ්‍යා සහ ප්‍රතිශතය
- හදිසි කාඩ්පත් (තමාගේ සහ අධීක්ෂණ නිලධාරියගේ අත්සන සහිත විය යුතුය)

ආ) මේසය මත තැබිය යුතු දේවල්.

ලේඛන/වාර්තා/පොත් - අධීක්ෂණ නිලධාරීන්ට පරීක්ෂා කළ හැකිවන පරිදි මේවා නිසි පරිදි තැබිය යුතුයි.

- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ දින සටහන් පොත (සෞ. 511) (මෙය ක්ෂේත්‍රයට යනවිට රැගෙන යා යුතුවේ)
- යෝග්‍යතා පවුල් ලේඛන (සෞ: 526) (අවුරුදු 5 කට වරක් නව ලේඛන සැකසිය යුතුයි)
- ගර්භනී මව්වරුන්ගේ ලේඛනය සෞ. 513
- උපත් හා ප්‍රතිශක්තිකරණ ලේඛනය පසිඇයි 3/79 (අවුරුදු 14 ක කාලයක් කාර්යාලයේ පවත්වා ගත යුතුය)
- පවුල් සංවිධාන මාසික වාර්තාව සෞ. 1200
- මාසික බලාපොරොත්තු ප්‍රසව ලේඛනය සෞ: 515
- පරිපෝෂිත ද්‍රව්‍ය ලේඛනය
- මිනු වට්ටෝරු ලේඛනය සහ දෙපාර්තමේන්තු උපදෙස්
- අමුත්තන්ගේ ලේඛනය
- කාල සටහන වෙනස් කිරීමේ පොත (මාසය අවසානයේදී මෙම වෙනස්කිරීම් අධීක්ෂණ නිලධාරියෙකු විසින් අත්සන් කළ යුතුය)
- දකිනුත් අදාල කාලීන වාර්තා
- විශේෂ කාර්ය ලිපි ගොනුව

ii. සටහන් පත්/ කාඩ්පත්/උපකරණ

- ගර්භනී සටහන් පත් සහ ඊ
- මාස 3 ක කාලයක් සඳහා පසු ප්‍රසව කාඩ්පත්

- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ දින වැඩ සටහන සෞ: 523 (අවුරුදු 1 කට වරක් ඉවත් කළ හැකිය)
- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ මාසික වාර්තාව සෞ: 524 - (අවුරුදු 5 ක කාලයක් කාර්යාලයේ තබා ගත යුතුය)
- පවුල් සංවිධාන ක්ෂේත්‍ර සටහන් සෞ: 1154 - (මෙය ගම අනුව සහ පවුල් සංවිධාන ක්‍රමය අනුව වෙන වෙනම අසුරා තැබිය යුතුයි.)
- ළමා වර්ධන සටහන් පත් (බී කොටස)
- අදාල සියලුම අලුත් කාඩ්පත්
- ප්‍රසව සටහන, පසු ප්‍රසව සටහන, මුත්‍ර පරීක්ෂණ සටහන
- සෞඛ්‍ය අධ්‍යාපන උපකරණ, පවුල් සංවිධාන උපකරණ (පෙති, රබර් කොපු)

- දෙපාර්තමේන්තුව විසින් නියම කරන ලද සියලුම ලේඛන, වාර්තා සහ කාඩ්පත් දී ඇති උපදෙස් පරිදි පරිහරණය කළ යුතුය.
- සෑම මාසයකම අවසානයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ මාසික වාර්තාව සහ පවුල් සංවිධාන මාසික වාර්තාව ඊළඟ මාසයේ 05 වන දිනට පෙර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

ඇමුණුම II

යෞවන පවුල් සංරක්ෂණය සඳහා උපදෙස්

i. තම ප්‍රදේශයේ සියලුම යෞවන පවුල් හැකි ඉක්මනින් හඳුනාගෙන ගෘහ ඇමතීම් වලදී කාන්තාව සහ පුරුෂයා සඳහා නියමිත පරිදි සංරක්ෂණය ලබාදීම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ මූලික වගකීමක් වේ.

ii. විවාහ වූ වහාම යුවල හඳුනාගෙන ගර්භණී භාවයට පෙර කාන්තාව සහ ස්වාමි පුරුෂයාට ලබාදිය යුතු දැනුවත් කිරීම සහ රැකවරණය ලබාදීම ඇයගේ සේවාවේ ප්‍රධාන කාර්යයක් වේ. උදා: ප්‍රථම දරුවා පමා කිරීමට අවශ්‍ය නම් පවුල් සංවිධාන ක්‍රම ලබාදීම, කාන්තාව තුළ යම් රෝගී තත්වයක් (උදා: හෘද රෝග, වලිප්පුව වැනි) ඇතිනම් ඒවා හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිකාර ලබාදීමට යොමු කිරීම, ගැබ් ගැනීමට බලාපොරොත්තු වන කාල සීමාවේදී ෆෝලික් අම්ල පෙති ලබාදීම, කාන්තාවන්ගේ ශරීර ස්කන්ධ දර්ශකය (BMI) පරීක්ෂා කර අවශ්‍ය උපදෙස් දීමත් රුබෙල්ලා ප්‍රතිශක්තිය ලබා නොමැති මව්වරුන්ට ගර්භණී වීමට පෙර එය ලබාදීම ආදිය සිදුකළ යුතුයි.

ii. නිරක්තිය ඇත්නම් එය නිවැරදි කිරීමට සෞ.වෛ.නි. වෙත යොමු කිරීම කළ යුතුය.

v. සෑම යෞවන පවුලක් සඳහා මාස 6 කට වරක් ගෘහ පිවිසීම කොට ඔවුන්ගේ සේවා අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගත යුතුය. ඒ අනුව යෞවන පවුල් ලේඛනයේ තොරතුරු ද යාවත් කළ යුතුය.:

පූර්ව ප්‍රසව සංරක්ෂණය සඳහා උපදෙස්

සෞඛ්‍ය ප්‍රදේශයේ සියලුම ගර්භණී මව්වරුන් (විවාහ වූ සහ විවාහ නොවූවන්ද ඇතුලුව) පල් ඇපිව සබඳතාවයෙන් ඔවුන් සඳහා ගුණාත්මක භාවයෙන් යුතු ක්ෂේත්‍ර හා සායනික සංරක්ෂණයක් ලබාදීමට යුතු කිරීම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ වගකීම වේ.

ගර්භණී භාවය දැනගත් විගස සියලුම ගර්භණී මව්වරුන් නිවසේදී ලියාපදිංචි කළ යුතු අතර හැකි ඉක්මනින් සායන සේවා සඳහා යොමු කළ යුතුය. ස්වාමි පුරුෂයා හා පවුලේ සාමාජිකයින් සමඟ ගර්භණී මවට නිවසේදී ලබාදිය යුතු රැකවරණය ගැන සාකච්ඡා කළ යුතුය.

II. මුල් ළමා විය සංවර්ධනය රැකවරණය සහ සංවර්ධනය සඳහා පූර්ව ප්‍රසව සමයේදී සිටම ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳව ගර්භණී මව සහ පියා දැනුවත් කිරීම කළ යුතුය.

III. ක්ෂේත්‍රයේ මව්වරුන් ලියාපදිංචි කරන විට ඔවුන් සායනයට පැමිණිය යුතු දිනයන් පිළිබඳව කලින් දැනුම් දිය යුතු අතර නියමිත දිනදී ඔවුන් සායනයට පැමිණේදැයි සොයා බැලීමට වගබලා ගත යුතුය. නොකඩවා සායනයට පැමිණීමේ අවශ්‍යතාවය ගැන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසින් මවට සහ ඇයගේ පවුලේ අනිකුත් අය දැනුවත් කළ යුතුය. සායනයට නොපැමිණෙන මව්වරුන් ගැන පසු විපරම කළ යුතුය.

IV. අවදානම් තත්ත්වයේ ඇති ගර්භණී මව්වරුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ඔවුන් වෙනුවෙන් වැඩිපුර ගෘහ පිවිසීම් කළ යුතු අතර විශේෂඥ සේවා සඳහා සෞ.වෛ.නි. විසින් අදාළ සායන/ආයතන වලට යොමු කළ යුතුය. එම අනතුරුදායක තත්ත්වයන් සම්බන්ධව නිවසේ අනිකුත් සාමාජිකයින් ද දැනුවත් කළ යුතුය. එවන අවදානමක් ඇති මවු ප්‍රසූතිය සඳහා කල්තියාම රෝහල් ගත කිරීමට කටයුතු කල යුතුය.

V. සංකූලතා නොමැති මව්වරුන් පූර්ව ප්‍රසව සායන සඳහා අනිවාර්යයෙන්ම පහත සඳහන් වාරවලදී පැමිණිය යුතු බව අවධාරණය කළ යුතුය.

- i. *පළමුවන පැමිණීම - ගර්භණීවූ වහාම (හැකි ඉක්මනින්)*
- ii. *දෙවන පැමිණීම - සති 19 දී*
- iii. *තුන්වෙනි පැමිණීම - සති 30-32 අතර*
- iv. *හතර වෙනි පැමිණීම - සති 38-40 අතර*

VI. අනුමත උප ලේඛනය අනුව සියලුම ගර්භණී මාතාවන් පිටගැස්ම රෝගයෙන් ආරක්ෂිත බවට වගබලා ගත යුතුය. ගර්භණී සමයේ මවගේ රුධිර ගණය හිමොග්ලොබින් පරීක්ෂණය හා VDRL පරීක්ෂණය කර ඇති බවට සහතික විය යුතුයි.

VII. පූර්ව ප්‍රසව මවුවරුන් සඳහා කණ්ඩායම් සාකච්ඡා සැලසුම් සහගතව සිදු කර අදාලවන සියලු කරුණු පිළිබඳව ඔවුන් දැනුවත් කල යුතුය.

VIII. සෙනසුරාද දින ක්ෂේත්‍ර කටයුතු සහ සායන කටයුතුවලදී රැකියාවල යෙදෙන මව්වරුන් සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය.

සූතිකා සංරක්ෂණය සඳහා උපදෙස් (ඇමුණුම IV)

i. ඇගේ කාර්යයේ සිටින සියලුම ගර්භණී මාතාවන්ට දරු ප්‍රසූතියේදී පුහුණු සහාය ලැබෙන බවට හා ආයතනික ප්‍රසූතියක් සැලසුම් කරන බවට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය වගබලා ගත යුතුය. මව සහ පවුලේ සාමාජිකයින් සමග සාකච්ඡා කොට දරු ප්‍රසූතිය සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කළ යුතුය. එසේ පිළියෙළ කරගත් කටයුතු පිළිබඳ විස්තර මව්වරුන්ගේ ගර්භණී සටහන්පතෙහි සටහන් කළ යුතුය.

ii. හදිසියේ ගෘහ ප්‍රසූතියක් සඳහා ඇය කැඳවුවහොත් එවැනි හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි පරිදි ඇයගේ ප්‍රසූත බෑගය සෑමවිටම සූදානම් කර තැබිය යුතුය.

iii. විෂබීජනාශක සැරසුම් සහ නියමිත උපකරණ තිබේදැයි පත්වෙයත් / තිබෙන බවටත් දරු ප්‍රසූතියේදී විෂබීජනාශක පිළිවෙත් අනුගමනය කරන බවටත් වගබලා ගත යුතුය.

iv. දරු ප්‍රසූතියක් කෙරෙන අවස්ථාවේදී සහ ඉන් පසුව කිසියම් ගැටළුවක් ඇති වුවහොත් ඒ සඳහා නිසි වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය ක්‍රියාකළ යුතුය.

v. ප්‍රසූත ස්ථානයෙන් පිටත්ව යාමට පෙර මව සහ දරුවා නිරෝගීව සිටින බවටත් අවශ්‍ය සියලුම උපදෙස් මවට ස්වාමි පුරුෂයාට සහ පවුලේ අයට ලබා දීමටත් ඇය වගබලා ගත යුතුය.

vi. සියලුම ගර්භණී මව්වරුන්ට ප්‍රසූතිය සිදුවූ වහාම ස්වාමි පුරුෂයා/ පවුලේ අයෙකු/ස්වෙච්ඡා සේවකයකු මගින් ඒ පිළිබඳව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියට දැනුම් දිය යුතුය.

සූතිකා සංරක්ෂණය සඳහා උපදෙස් (ඇමුණුම V)

සෑම මවකටම දරු ප්‍රසූතියෙන් පසු ගුණාත්මක භාවයෙන් යුතු පසු සූතිකා සංරක්ෂණයක් ලබාදීම සඳහා පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

රෝහල් දරු ප්‍රසූතියකදී පහත සඳහන් අයුරින් ගෘහ පිවිසීම කළ යුතුය.

ප්‍රසූතියට පසු මුල් දින 3 ඇතුළතදී එක් වරක් ද,
දින 3-10 දක්වා දෙවරක්ද,
දින 11-28 දක්වා එක් වරක්ද,
දින 42 ආසන්නයේ දී එක් වරක් ද යා යුතුය.

නිවසේ සිදුවූ දරු ප්‍රසූති සඳහා

පළමු දින 3 ඇතුළතදී එක් වරක් ද,
දින 3-10 දක්වා එක් වරක් ද,
දින 11-28 දක්වා එක් වරක් ද,
දින 42 ආසන්නයේදී එක් වරක් ද යා යුතුය.

සූතිකා ගෘහ පිවිසීමේදී මව සහ දරුවා නිසි පරිදි පරීක්ෂා කර අවශ්‍ය උපදෙස්/සේවා සැපයිය යුතුය.

ළ .

අ) නවසිව දිනට දරුවා සිවුවැදිව ජීවත්වන පසු, නවසිව දින කාර්ඩ්පත සටහන් යන බවට වගබලා ගත යුතුය.

ආ) එම නොදින් පරීක්ෂා කළ යුතුය. (යෝනි ප්‍රදේශය ද ඇතුළුව)

ඇ) සෑම දරුව සම්බන්ධයෙන් ළමයාගේ ඇසිරිය හැකි සංකූලතා පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

ඈ) සෑම දරුව මාසයික අධීක්ෂණය හා අනිකුත් අවදානම් තත්ත්වයන් පිළිබඳව මහජනාම පුරුෂයා සහ එම පවුලේ අය දැනුවත් කළ යුතුය.

ඉ) ළමයේ කිරි පෝෂණය සඳහා උපදෙස් දීම කළ යුතුය.

ඊ) රැකියා කරන මව්වරුන් සඳහා දරුන නිවාඩු, මවකිරි දීම සඳහා පැයක නිවාඩු යනාදි මව්වරුන්ගේ අයිතීන් පිළිබඳව ඔවුන් දැනුවත් කළ යුතුය.

උ) පවුල් සංවිධාන ක්‍රම පිළිබඳව සැලක දැනුවත් කර අවශ්‍ය උපදේශනය ලබාදිය යුතුය.

ඌ) එම දරුව සංරක්ෂණය ලබාදීමට වගාණම සුදුසු පුද්ගලයා ක්ෂේත්‍රයේ ප. සෞ. ශේ. සි බවට විශ්වාසය තහවුරු කර ගත යුතුයි.

අලුත උපන් බිළිඳා.

අ) අලුත උපන් බිළිඳාගේ කිසියම් අසාමාන්‍ය තත්ත්වයක් තිබේදැයි පරීක්ෂා කළ යුතුය.

ආ) පෙකණිවැල් ආසාදන තත්ත්වයක් ඇත්දැයි සොයා බැලිය යුතුය.

ඇ) නවසිව්දින, නැව්ම සහ ළදරු සංරක්ෂණය පිළිබඳව අවශ්‍ය මග පෙන්වීම කළ යුතුය.

ඈ) කිසියම් අසාමාන්‍ය තත්ත්වයකින් යුත් ළදරුවෙක් ළගම ඇති වෛද්‍ය ආයතනයට යොමු කළ යුතු අතර, ඒ අනුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිට දැනුම් දිය යුතුය.

ඉ) දරුවන මාස 4 සිට 6 දක්වා බිළිඳාට මව්කිරි පමණක් දීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

ඊ) මවට සහ අලුත උපන් දරුවාට යන දෙදෙනාටම සැලසිය යුතු සේවා පිළිබඳව ස්වාමි පුරුෂයාට පවුලේ සාමාජිකයන්ට අවශ්‍ය උපදෙස් දිය යුතුය.

උ) ඇයගේ ප්‍රදේශයේ සියලුම උපත් නොපමාව ලියාපදිංචි කරන බවට වගබලා ගත යුතුය.

ඇමුණුම VI

ළදරු ළමා සංරක්ෂණය සඳහා උපදෙස්

ප්‍රදේශයේ සිටින සියලුම ළදරුවන් සහ පෙර පාසල් දරුවන් සඳහා සිටි රැකවරණයක් ලබාදීමට සහතු සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

I. අවම වශයෙන් ළදරුවන් සඳහා මසකට වරක්ද, අවුරුදු 1-3 දක්වා පූර්ව පාසල් ළමුන් සඳහා මාස 2 කට වරක්ද, අවුරුදු 3-5 දක්වා ළමුන් සඳහා මාස 3 කට වරක්ද යනා ඇවිදීම සිදුකළ යුතුය.

ii. නිවැරදි මව්කිරි දීම සහ අමතර ආහාර ලබාදීම පිළිබඳව මව, පියා සහ පවුලේ සාමාජිකයින් දැනුවත් කළ යුතු අතර එම පෝෂණ උපදෙස් නිසි ලෙස පිළිපදින්නේ දැයි සොයා බැලිය යුතුය.

iii. උපතේ සිට අවුරුදු 2 දක්වා දරුවන් මසකට වරක් බැගින්ද අවුරුදු 2-5 දක්වා දරුවන් මාස 3 කට වරක්ද බර කිරා සටහන් කළ යුතුය. මෙ හැර බර අඩු දරුවන් සහ මන්දපෝෂණ තත්වයට පත්වූ දරුවන් මසකට වරක් ගෙන්වා අවශ්‍ය මැදිහත්වීම් සිදුකළ යුතුය. බර කිරා සටහන් තබන සෑම විටකම මව, පියා හා පවුලේ සාමාජිකයින් ඒ පිළිබඳ දැනුවත් කළ යුතු අතර අවශ්‍ය පෝෂණ උපදෙස් ද ලබාදිය යුතුය. බර කිරීම සඳහා නොපැමිණෙන දරුවන්ට වැඩි අවධානයක් යොමු කර ඔවුන්ව ගෙන්වා ගෙන ඉතාමුතුලව බර කිරීමට කටයුතු කළ යුතුය. මැදිහත්වීම අසාර්ථක හෝ වෙනත් රෝගී තත්වයන් ඇතැයි සැක කරන දරුවන් හඳුනාගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීට යොමු කිරීමට කටයුතු කළ යුතුය. ගැටලු ඇති දරුවන් පසු විපරම් කර මැදිහත්වීම සාර්ථක දැයි සොයා බැලිය යුතුය.

iv. ක්ෂේත්‍රයේ බර කිරීමේ මධ්‍යස්ථාන ගම් මට්ටමින් අධීක්ෂණ නිලධාරීන්ගේ මඟපෙන්වීම යටතේ සංවිධානය කර කලින් සැලසුම් කරගත් දින අනුව නිසි පරිදි පවත්වා ගෙන යා යුතුය.

v. ළදරු ළමා අවධියේ වර්ධන පියවරයන් නිසි ලෙස සටහන් කර ඒ පිළිබඳව මව, පියා සහ පවුලේ සාමාජිකයින් දැනුවත් කළ යුතුය. ගැටලු ඇති දරුවන් කලින්ම හඳුනාගෙන යොමු කිරීම කළ යුතුවේ.

vi. මුල් ළමාවිය තුළ දරුවන්ගේ මනෝ සමාජීය රැකවරණය ඇතුළු සමස්ථ අවශ්‍යතා පිළිබඳව මව, පියා සහ පවුලේ සාමාජිකයින් දැනුවත් කළ යුතු අතර එම අවශ්‍යතා සපුරාලීමට ඔවුනට උදව්වීමත්, එම අවශ්‍යතා සැපිරෙන්නේ දැයි සොයා බැලීම කළ යුතුය. නිවස පදනම් කරගෙන ඔවුන්ගේ මනෝ සාමාජීය සංවර්ධනය උගන්වා කර ගැනීම, සඳහා රැකබලාගන්නන්ට අවශ්‍ය දැනුම, සහයෝගය හා මග පෙන්වීම ලබාදිය යුතුය.

vii. ළදරු ළමා වර්ධන සටහන් පත් යාවත් කිරීමෙන් ළදරු ළමා සංවර්ධනය පිළිබඳ නිවැරදි දත්ත සංචිත කිරීමටත් මාසිකව ඒවා සෞ.වෛ.නි. වෙත යොමු කිරීමටත් කටයුතු කළ යුතුය.

viii. දරුවාගේ වර්ධන සටහන් පතෙහි නිවැරදි තොරතුරු ඇතුල් කර යාවත්කාලීන කළ යුතුය.

ix. ගෘහ අවදානම් තත්වය, ගෘහ අනතුරු සඳහා අවදානම් තත්වයන්, ළමා අපයෝජනය කෙරෙහි නැඹුරු ඇති දරුවන් ද හඳුනාගෙන එම තත්වයන් පිළිබඳව මැදිහත්විය යුතු ආකාරය සෞඛ්‍ය කණ්ඩායම සමග සාකච්ඡා කර ඔවුන්ගේ උපදෙස් මත මැදිහත්වීම සිදුකළ යුතුය.

x. දරුවන්ගේ ආරක්ෂිත ජල සැපයුම් සහ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳවද පුද්ගලික ස්වස්ථතාවය පිළිබඳ ගෘහ ඇවිදීම් වලදී සොයා බැලීමට කටයුතු කළ යුතුය. තවද විශේෂ රැකවරණයක් අවශ්‍ය බවට හඳුනාගත්තා දරුවන්ට අවශ්‍ය පරිදි වැඩිපුර ගෘහ ඇවිදීම් කර රැකවරණය ලබාදීමට කටයුතු කළ යුතුය.

xi. ගෘහ අවදානම් තත්වයන් කලින්ම හඳුනාගෙන සුදුසු පරිදි මැදිහත්වීම කළ යුතු අතර ගෘහ පිවිසීම්වලදී එවැනි පවුල්වලට ප්‍රමුඛතාවය ලබාදිය යුතුවේ. මැදිහත්වීම සාර්ථක දැයි පසුවිපරම් කර සොයා බැලිය යුතුය. අවශ්‍ය විටෙක සෞඛ්‍ය කණ්ඩායමේ අන් අයගේ සහාය ලබාගත යුතුය.

xii. විශේෂ රැකවරණයක් අවශ්‍ය (විශේෂ සෞඛ්‍ය ගැටලු ඇති) දරුවන් හැකි ඉක්මනින් හඳුනාගැනීමත් ඔවුන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මගින් අවශ්‍ය ප්‍රතිකාර හා සමාජ සංරක්ෂණ සේවා සඳහා යොමු කිරීමත් එම දරුවන් සඳහා පසු විපරම් කිරීමත් කළ යුතුය.

xiii. ළදරුවන් සහ දරුවන් වයසට අනුව ප්‍රතිශක්තිකරණය සහ විටමින් A ලබාදීම සම්පූර්ණ කල යුතු අතර ඒවා ලබාදී ඇති බවට සටහන් පවත්වා ගත යුතුය.

xiv. ප්‍රජාවේ, පාචන රෝග සහ ශ්වසන රෝග මර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සජීව දායකත්වය දිය යුතුය.

xv. ප්‍රතිශක්තිකරණයට ලක්වූ දරුවන් වෙනුවෙන් පසු විපරම් කර ප්‍රතිශක්තිකරණය/නිසා ඇතිවූ අහිතකර සංසිද්ධීන් පිළිබඳව සොයා බලා යොමු කිරීම සිදුකල යුතුය.

xvi. සමා භාරයේ ජීවත් දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වයන් පිළිබඳව විශේෂ වර ඇගයීමට ලක්කර ඒවා වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

පාසැල් හා යොවුන් සෞඛ්‍ය සංරක්ෂණය ඇමුණුම VII

i. ගෘහ පිවිසුම් වලදී යොවුන යොවුනියන්ගේ අවශ්‍යතාවයන් සොයා බලා අවශ්‍ය සේවාවන් ලබාදීම/යොමු කිරීම කළ යුතුයි

ii. යොවුන විය ආශ්‍රිත ගැටලු සහිත ළමුන් හඳුනාගෙන ඔවුන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ යුතුයි

iii. එක් එක් ප්‍රදේශයට විශේෂිත වූ යොවුන් සෞඛ්‍ය ගැටලු හඳුනාගෙන ඒවා අඩු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට වගබලා ගත යුතුය.

iv. පාසැල් වෛද්‍ය පරීක්ෂණවලදී හඳුනාගත් ගැටලු සහිත දරුවන්ගේ ප්‍රතිකාර ලබා දෙන ලද යොමු කිරීම පිළිබඳව එවැනියන් ක්‍රියාත්මක වේදැයි සොයා බලා අවශ්‍ය මග පෙන්වීම කළ යුතුයි.

ඇමුණුම VIII

පවුල් සංවිධාන සේවා සඳහා උපදෙස්

සෑම ප්‍රදේශයකම යෝග්‍යතා පවුල් සඳහා පවුල් සංවිධාන සේවාවන්හි අවශ්‍යතාවයන් ඇති පරිදි හඳුනාගෙන ඔවුන් සඳහා සේවා සැපයීම/උපදේශනය කිරීම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ වගකීමක් වේ. මෙවැනි අවස්ථාවල පවුල් සංවිධාන සේවා අවශ්‍ය වෙනත් පුද්ගලයින්ද හඳුනාගෙන ඔවුන්ද එම සේවා පිළිබඳ දැනුවත් කර ක්‍රම ලබා ගැනීම සඳහා යොමු කළ යුතුවේ.

I. පවුල් සැලසුම් සායනවලට (ස්ත්‍රී සහ ආයතන) යොමු කිරීමට කටයුතු කළ යුතුය.

II. පවුල් සංවිධාන ක්‍රම ලබාගත් ප්‍රතිග්‍රාහකයන් වෙනුවෙන් දී ඇති උපදෙස් අනුව පසු විපරම් කර ඔවුන්ට ඇතිවන අතුරු ආබාධ පිළිබඳ සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යොමු කිරීම කළ යුතුය.

III. පවුල් සංවිධාන (ගිලින පෙති, රබර් කොපු) ක්ෂේත්‍රයේදී අවශ්‍ය ප්‍රතිග්‍රාහකයින්ට සැපයිය යුතුය. රබර් කොපු භාවිතා කරන්නන් සඳහා එය (නිදර්ශකයක් භාවිතා කර) නිවැරදිව භාවිතා කිරීම පිළිබඳව කරුණු පෙන්වීම සිදුකල යුතුය.

iv. ගෘහ පිවිසුම් හා සායනවලදී පවුල් සංවිධාන ක්‍රම පිළිබඳව සෞඛ්‍ය අධ්‍යාපන උපකරණ භාවිතා කර ක්‍රම පිළිබඳව දැනුවත් කළ යුතුයි.

v. පවුල් සංවිධාන ක්‍රම භාවිතා කළ යුතු නමුත් භාවිතා නොකරන යුවල් ද නිසි පරිදි හඳුනාගෙන ඔවුන් සේවා ලබාගැනීම සඳහා උනන්දු කරවිය යුතුය.

vi. රැකියාවන්වල නිරත, නිතර හමුවීමට අපහසු කාන්තාවන් සඳහා ඔවුන්ගේ අවශ්‍යතා අනුව ඉල්ලුමට ගැලපෙන සේවා සපයනට සලසාගත යුතුයි.

ඇමුණුම IX

සායන පවත්වාගෙන යාම සඳහා උපදෙස්

සෑම ප්‍රදේශය තුළ ඇති සායන එම ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ භාරයේ පවතී. එට අමතරව සෑම ප්‍රදේශයේම මව්වරුන් සහ ළදරුවන් සහභාගී වන සායන සඳහා සහ වැඩි/ආවරණය කරන ප්‍රදේශවල සායන සඳහාත් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය සහභාගී විය යුතුය. සායනව පෙර දින පෙර සූදානම් කිරීම කළ යුතු අතර සායනික සේවාව පෙ.ව.08.00 වන විට විවෘතව පැවතිය යුතුයි.

i. පිළියෙල කරන ලද සෞඛ්‍ය අධ්‍යාපන සැලැස්ම අනුව දැනුවත් කිරීමේ සාකච්ඡා / ප්‍රායෝගික සැසි පැවැත්විය යුතු අතර කාලීනව බලපවත්වන සෞඛ්‍ය ප්‍රශ්නවලදී ඒ පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන් වල නිරත විය යුතුය.

ii. සායනය පවත්වාගෙන යනු ලබන නිලධාරියා හට අවශ්‍ය සහාය දිය යුතුය.

iii. මව්වරුන් සහ ළදරුවන් හා අනිකුත් අවශ්‍ය කණ්ඩායම් ප්‍රතිශක්තිකරණ කාලසටහනට අනුව අදාල කාලයන්හි ප්‍රතිශක්තිකරණය කළ යුතුය. එන්නත් ලබාදීමේදී මව්වරුන් දැනුවත් කළ යුතුයි. එන්නත් ලබාදීමට පෙර එන්නත් කුප්පි හොඳින් පරීක්ෂා කර බලා ඒවා එන්නත් කිරීමට සුදුසු තත්වයේ පවතින බව තහවුරු කරගත යුතු අතර භාවිතා කරන උපකරණ වල විෂබීජහරණ භාවිය ආරක්ෂා කළ යුතුයි.

iv. සායන සැසිය අවසානයේදී සියලුම සායන ලේඛන, වාර්තා, ලේඛන නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරි සායන කටයුතු සැලසුම් කළ යුතුය. සෞඛ්‍ය මධ්‍යස්ථානය මනාව සකස් කොට තැබිය යුතුය.

ඇමුණුම X

සුවනාරී සායනික කටයුතු සඳහා උපදෙස්

i. සෑම ප්‍රදේශයේ සිටින අදාල වයස් කාණ්ඩයේ කාන්තාවන් සායනය වෙත යොමු කිරීම ඇයගේ කාර්යභාරය වේ. ස්වයං පියයුරු පරීක්ෂාව ගැන හා සායනික සේවාවන් ගැන කාන්තාවන් දැනුවත් කළ යුතුය. මෙම යොමු කිරීම ලබාගත් දින ඇමතුම් අනුව කිරීම වඩාත් යෝග්‍යය.

ii. සායන කටයුතු අනෙක් කාර්ය මණ්ඩල සමග එක්ව සංවිධානය කළ යුතුය. සායනය පවත්වන නිලධාරියාට අවශ්‍ය සහාය ලබාදිය යුතුය.

iii. රෝගී තත්වයන් ඇති බවට හඳුනාගත් කාන්තාවන් සඳහා ක්ෂේත්‍රයේදී පසු විපරම් කොට අවශ්‍ය සේවාවන් සඳහා යොමුව ඇත්දැයි සොයා බැලිය යුතුය. යොමු කළ පසු සේවා සඳහා අදාල ආයතන වෙත යොමු කළ රෝගීන් පිළිබඳව තොරතුරු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී දැනුම් දිය යුතුය.